| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | ප.ඉ.කො./ඉ/11/ES බලපත්‍ර | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2013.08. 7 |

ප්‍රාදේශීය ලේකම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

කළුතර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## E.S. බලපත්‍ර සහිත රජයේ ඉඩම් සඳහා කටයුතු කිරීම සම්බන්ධ උපදෙස් මාලාව

කළුතර දිස්ත්‍රික්කයේ 1979 අනවසර සමීක්ෂණයෙන් හඳුනා ගත් E.S. බලපත්‍ර නිකුත් කරන ලද අනවසර කරුවන් සම්බන්ධයෙන් පහත දැක්වෙන උපදෙස් අනුගමනය කරමින් ඉදිරි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

පහත දැක්වෙන පියවරයන් අනුගමනය කරන්න

**1 පියවර** :- E.S බලපත්‍ර ඉඩම්වල තොරතුරු රැස් කිරීම.

මේ සමඟ ඇති ආදර්ශ ආකෘතිය අනුව ග්‍රාම නිලධාරි විසින් ක්ෂේත්‍ර තොරතුරු වාර්තා කිරීම.

**2 පියවර** :- ඉඩම් ක්ෂේත්‍ර නිලධාරින් විසින් ආදර්ශ ආකෘතියේ තොරතුරු අනුසාරයෙන් අදාල ඉඩම් වර්ගීකරණය කිරීම හා නිර්දේශ ලබා දීම.

2.1) 1979 සමීක්ෂණ අවස්ථාවේදී සත්‍ය වශයෙන් හඳුනා ගන්නා ලද පුද්ගලයාට බැහැර කර ඇති E.S බලපත්‍ර සහිත ඉඩම්

2.2) මුල් බලපත්‍රලාභියාගේ කලත්‍රයා හෝ තුන් වන උපලේඛණගත ලේ ඥාතීන් භුක්ති විඳින ඉඩම්

2.3) 2.1. හා 2.2 ට අයත් නොවන පිටස්තර පුද්ගලයන් පදිංචි / භුක්ති විඳින ඉඩම්

(මෙහිදී **1985** වසර තෙක් නිකුත් කල **E.S** බලපත්‍ර හෝ දිසාපති විසින් නිකුත් කල **E.S** බලපත්‍ර සත්‍ය ලෙසම නිකුත් කල **E.S** බලපත්‍ර ලෙස සලකන්න. ඉඩමේ සංවර්ධිත තත්ත්වය සැලකිල්ලට ගැනීම ඉතා වැදගත්ය.)

**3 පියවර** :- වර්ගීකරණය කරන ලද ආකෘති පත්‍ර සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම.

**4 පියවර** :- ඉහත 3 වන පියවරේදී සත්‍ය ලෙසම E.S බලපත්‍රලාභීන් ලෙස හඳුනා ගන්නා ලද පුද්ගලයන් වෙත පහත අවස්ථාවන් අනුව තීරණ ගැනීම සුදුසු වේ.

i) ගොවි පන්තියේ තැනැත්තන් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනතේ 20 'අ' වගන්තිය යටතේ අනුමැතිය ලබා ගෙන බලපත්‍ර ලබා දීම.

ii) ගොවි පන්තියේ නොවන තැනැත්තන් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනතේ 20 'අ' වගන්තිය යටතේ අනුමැතිය ලබා දී ගැනුම් මිල අය කර බලපත්‍ර ලබා දීම.

**ගැනුම් මිල අය කිරීම** - E.S. බලපත්‍ර ලබා දුන් වර්ෂයට අදාළව ඉඩමේ තක්සේරු මුදල ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. ඉඩමේ තක්සේරු මුදල එකවර හෝ වාරික දහයකින් අය කර ගත හැක. පලමු වාරිකය අය කර බලපත්‍රයක් ලබා දීමේ අවස්ථාව පවතී. සම්පූර්ණ මුදල ගෙවන තෙක් දීමනාපත්‍රයක් ලබා දිය නොහැක. තක්සේරු මුදලින් නොගෙවා ඉතිරි වන මුදල සඳහා 10% ක පොලියක් අය කල යුතු වේ

iii) වාර්ෂික ආදායම රු.261,120.00 කට වැඩි තැනැත්තන් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු ලබා දිය යුතුය.

5 පියවර :- ඉහත වර්ගීකරණයන්ට පරබාහිර ඉඩම් කැබලි සඳහා 2008.08.20 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008/04 චක්‍රලේඛය අනුව ක්‍රියා කිරීම සුදුසු වේ.

ඊ.ඒ.ආර්.රේණුකා
පළාත් ඉඩම් කොමසාරිස්
බස්නාහිර පළාත

o/c

පිටපත -

I. ඉඩම් කොමසාරිස් ජනරාල් - කරු.දැ.ගැ.ස
II. දිස්ත්‍රික් ලේකම්, කළුතර - කරු.දැ.ගැ.ස
III. ලේකම්, පළාත් ඉඩම් අමාත්‍යාංශය (බ.ප) - කරු.දැ.ගැ.ස